හොඳ සිංහල

පැදිය සහ මන්තරය

'රන් ස්වරයාණන් නිහඬ විය' යන සිරසින් කොඩිතුවක්කු ලක්සුමනයන් විසින් පබඳින ලද 'නිසඳැස් පැදි' ලෙස සැලකිය හැකි ලියවිල්ලක් පසු ගිය නොවැම්බර් සන්නසේ පල වී තිබිනි.

ප්‍රේමසිරි කේමදාසයන්ගේ රුවකක් ද (Photo) එහි ඇති නිසා එය ඔවුන් හා බැඳි පබඳක් බව සිතා ගත හැකිය. එහෙත් ඔවුන්ගේ රුවත හඳුනාගත නොහැකි කෙනෙකුට එය අපබ්‍රංසයක් වීම නොවැලැක්විය හැකිය. 'බමරු රොන් නොදරා නෙලා ගත් මල ඔබේ දෙන අසල තැබුවා' යන වැකිය නිසා එම ලියවිල්ල කිසියම් මිය ගිය කෙනෙකු උදෙසා ලියූ වක් බවට ඉඟියක් ලැබේ.

(වෙද + ආණ) වෙදාණ + අන් = වෙදාණන්, (පිය + ආණ) පියාණ + අන් = පියාණන්, (සිටු + ආණ) සිටාණ + අන් = සිටාණන්, වැනි පද ගැන සිතා සාදා ගෙන අති 'ස්වරයාණන්' යන්න ගැම්මකට ඇති පදයක් ලෙස සැලකිය නොහැක.

(රන්) සර ඇත්තේ (රන්) සර + ඉ = සැරි යනුවෙන් වචනයක් හදා ගෙන යලි + ආණ = සැරියාණ යන වචනය හදා ගත හැකි බව පෙනේ. අනතුරුව එය සැරියාණ + අන් = සැරියාණන් (සැරියාණ + ඕ = සැරියාණෝ) යනුවෙන් වර නැඟිය හැක.

(ගම් + ඉ) ගැමි + ආණ = ගැමියාණ + අන් = ගැමියාණන් යන පදය හැදෙන්නේ ඒ නියරට අනුවය. සුබැසියාණන් තවත් එබඳුම පදයකි.

තොට + ආ = තොටා, නිවස + ආ = නිවසා, රට + ආ = රටයා වැනි පද අපේ බසේ වහරට පැමිණ නැතත් (ගම් + අ) ගම + ආ = ගමයා, (ගොං) ඔලුව + ආ = (ගොං) ඔලුවා (පින් + බත්) පිම්බතා, (රා බඩ) රාබඩා දුබලගනයේ වියහරක් ඇති බව පෙනේ. ඒ අනුව නම් (රන්) ස්වර + ආ = ස්වරයා + ආණ = ස්වරයාණ + ස්වරයාණ + අන් = ස්වරයාණන් යන පදය හදා ගත හැක. එහෙත් සමාස කිරීමේ දී 'රන්' වෙනුවට 'ස්වර්න' යෙදූ විටය එහි එක්තරා 'ගතියක්' ඇති වන්නේ.

'ස්වර්න ස්වරයානන්' යන්න උවද උක්තය සඳහා ගත හැකි නොවේ. 'ස්වර්න ස්වරයානෝ' යෙදුවත් ඒ වැකිය නිවරද වීමට නම් 'ස්වර්න ස්වරයානෝ නිහඬ වූහ' යනුවෙන් ආඛ්‍යාතය ද වෙනස් විය යුතුය.

ලියන්නකුට (ලේඛකයකුට) තද වූ විට කොහෙන් හෝ වචනයක් ඇද ගැනීම අද ඊයේ ඇති වූ සිරිතක් නොවේ. විරිත එළිවැට රැකීම සඳහා 'විසුලු වදන්' යෙදීම ඉවසිය යුතු බව කියති. මෙතන එබඳු හිරයක් දක්නට නැත.

ආන - අනි - අනු - නිත්‍ය බහු වචන ප්‍රත්‍ය නිසා ඒවා ඒක වචන විබක්ති යොදා වරනැඟිය නොහැකිය. සිටානා, පියානා, පුතනුවා, තෙරනුවා, යන වහර ඇති නොවූයේ ඒ නිසාය.

එහෙත් දියනිය, මෑනිය, නැන්දනිය, මිත්තනිය, තෙරනිය යන වහර අද දක්නට ලැබේ. එය වෙනස් කල යුතු ද? වෙනස් කල හැකි ද? වෙනස් වී ඇති වියහරක් ආ පස්සට නො ඇදිය යුතු බව සමහරු කියති. හේ හඬයි - ඔහු හඬති - මම ඔහු හඬවමි - මම ඔවුන් හඬවමි යනු නිවැරදි වැකි හතරකි. 'ඔහු' උක්ත වූ විට බහු වචන වන අතර අනුක්ත වූ විට ඒක වචන වේ. ඔහු හඬති - මම ඔහු හඬවමි යන දෙ වැකිය නිවරදි වන්නේ එහෙයිනි. ඔහු + හු = ඔව්හු යන විකාර පදය අද බෙහෙවින් දක්නට ලැබේ. කෙසේ වෙතත් එදා සන්නසේ ඇති, '.... කුණු කල වල දුගන්ධය ආශ්වාදය කිරීමේ අභිප්‍රායෙන් සංචාර කරන්නෝ ද ඇති බව.....' (වල ඈත් කොට ලියූ විට තේරුම වෙනස් වේ. දුගඳ - දුර්ගන්ධය නිවැරදිය. ආශ්වාස - ආශ්වාදය තේරුම් දෙකකි. සංචාරය යනු එතැනට සුදුසු පදයයි. 'කරන්නෝ' සදොස්ය. එතනට යෙදිය යුත්තේ 'කරන්නන්' ය. '.... මඟට බට මා .... තවත් එක් මාතලි පුත්‍රයෙක් බවට පත් වීමි.' (මා .....වීමි සදොස් නිසා එය 'මම..... වීමි' විය යුතුය. 'මම ...පුත්‍රයෙක් බවට පත් වීමි' නිදොස් වැකියකි. එහෙත් 'මම ... පුත්‍රයෙක් බවට පත් වීමි' සදොස් ය. එය නිවරද වන්නේ 'මම ... පුත්‍රයෙකු බවට පත් වීමි' වූ විටය. මේවා යතුරු දොසින් සිදු වී ඇද්දැයි නො දනිමි) වැනි වැකි දකින විට 'මා මේ කරන්නේ තේරුමක් ඇති වැඩක් ද' යන සිතිවිල්ල පහල වේ.

දැන් අපි 'රන් ස්වරයාණන් නිහඬ විය' යන ප්‍රබන්දයේ ඇති නිසඳැස් පැදිය හෙවත් සින්දුව ගැන කෙටි විමසීමක් කරමු.

1. ජීවිතය * මියුරු සර ගීතයක් කළ - ඔබ ගිය
* මඟ පාර දිගේ - මල් සුවඳ නොව මිනිස් සුවඳට -
ඉව අල්ලා - සුළං*කුරුල්ලෝ* සුදු පැහැති පියාපත් ගලවා - පොළොවට විසි කළා.

'(මියුරු) සර ගීතයක් (ස්වර ගීතයක්)' යන වචනය මට හුරු නැත. ලක්සුමනයන් එයින් කුමක් අදහස් කලාදැයි නො දනිමි. 'මඟ පාර දිගේ' නිවැරදි නම් 'සමුදුර මුහුදු ගොඩ ගලා, ගෙය නිවස සරසා, රුකා ගස මලින් කුසුමින් බර වී' වැනි යෙදුම් ද නිවරද විය යුතුය. සුළඟ කුරුල්ලන් සේ සිතා ගත හැකි වෙතත් 'සුදු පියාපත්' යනු 'සුදු කොඩි' දැයි නිනව්වක් මට නැත. 'සුළං කුරුල්ලෝ වෙනුවට සුළං කුරුල්ලන් ලිය උනා නම් ඒ වැකිය නිදොස් වේ.

2. 'බමරු ඇවිත්*මල් නොතලා රොන් නොදරා - නෙලා ගත් මල - සැබෑ බමරුන් ලොවට පෙන්නූ - රන් ස්වරයේ වරුණ කියමින් - වෙණ ත්ත වයා - තැබුවා ඔබේ දෙන අසල

'මල්' යන්න එතනට අවශ්‍ය නැත. 'බමරු ... සැබෑ බමරුන්... වරුණ කියමින්' යන්නේ බමරුන් සහ සැබෑ බමරුන් කව්දැයි සිතා ගත නොහැක. 'බමරු රොන් නොදරා නෙලා ගත් මල ඔබේ දෙන අසල තැබුවා' යන වැකියේ බමරු යන්න බමරුන් විය යුතුය.

3. කාලය සමඟින් දම්මි සුගත් වෙනස් වී ඇත - එහෙත් ඔබ වැයූ වෙණ තත - ගොළු හඳවත් නලවන - නොවෙනස් ව ඇසෙන රාවය - ආදර හසුන් පතටත් - එස් එම් එස් තිරයටත් පොදුයි - ඒ පරපුර අදත් අසා සිටී - සදාතනිකයි - නොමියෙන බව දනිමින්.

දම්මි සුගත් වෙනස් වී ඇත්තේ කෙසේද ? වයන්නේ වෙණ ද වෙන තත ද? රාවය ආදර හසුන් පතට බලපාන්නේ කෙසේ ද? 'සදාතනිකයි - නොමියෙන බව දනිමින්' දෙපදයේ අදහස ගලපා ගත නොහැක. 'දනිමින්' වියහරේ නැතත් නිවැරදි වචනයකි. දැන දැන යනු එහි තේරුමයි.

4. අඳුරු කුටිය තුල දොරගුළු හැර ලූ - පැල්පතේ කම්හලේ - ගොව්පොළේ දෙවියෝ - ගිනියම් අව්වද මහ වරුණාව ද - උණු කඳුළු කර - වැලපුනා රන් ස්වරයේ දෝංකාරය අසලා.

'දෙවියෝ ... වැලපුනා' නිදොස් වැකියක් නොවේ. වර්ණාව - වැස්ස - වරුසාව මිස 'වරුණාව' ක් අපේ බස් වහරේ නැත. 'රන් ස්වරයේ දෝංකාරය අසල වැලපුනා', දෝංකාරය බිතක් හෝ කනුවක් වැනි දෙයක් නම් ඒ අසලට වී දෙව්යන්ට වැලපෙන්නට හැකිය. අඳුරු කුටිය තුල තිබි දොරක අඟුල් හැරියා ද, අඳුරු කුටියේ දොර හැරියා ද යන්න නොතේරේ.

5. අහස් ගව්වෙන් ඔබ්බට ගිය - ඔබේ හින්නද ස්වරය - මගේ හඳවත ලෙසින් ඔබ - හඳුනාගෙන ඔබ මා ලෙස මහ මුහුදම ගොඩට ගලා - රත් වුණු හිරු පායන දවසටත් - හරිම සිසිලසයි.

තනි වැකියක් වූ මේ කවිය තේරුම් ගත හැකි කෙනෙකු සිටිද්දැයි නොදනිමි. මෙය තේරුම් ගන්නට වෑයම් කරන්නාට කරකැවිල්ල හැදේ. ගොඩගලා ඇත්තේ මුලු මහත් මුහුද ම වීම අරුමයකි. මහ මුහුදම ගොඩට ගැලීම නිසා රත් වූ හිරු පායන දවස හීතල දවසක් වේ. මහ පුදුමයකි.

6. සීත රෑ යාමේ අඳුරේ - සමුදු සයනේ - සිනිඳු ඇති - රිල්ලක නිදන - ඔබ රුව දකින්නට - අපි දිව රෑ බලා සිටින්නෙමු.

'ඔවුන්ගේ මල සිරුරු ඇත්තේ අප සිටින තැන නොවේ. වෙනත් තැනකය. එය ගෙනෙන තෙක් අප දිවා රෑ මඟ බලමින් සිටින්නෙමු.' මෙහි සැඟවී අරුතයි.

7. උ ප දි න' න මියුරු සර - ගිම්හානයේ රතු පාට හිරු යට - වසන්තයේ දවසක් ලෙසින් - නාඳුනන සිහිනයක් විලසින් වත් විත් - අග්නියේ සිහිල් දිය බිඳුව ලෙස - මානස විල මැද - නැවත රඟන්නට.

ඔවුන් මේ කවියෙන් කුමක් කියද්දැයි තේරුම් ගත නො හැක. නාඳුනන සිහිනයක් හඳුනන සිහිනයක් මා නොදන්නා දෙයක් නිසා නිහඬ වෙමි. අග්නියේ සිහිල් දිය බිඳුව ද ඒ බන්දකි.

සින්දු හෙවත් ගීත කිපයක කොටස් ඇතුලු කොට යම් අදහසක් අපට දීමට ලක්සුමනයන් උත්සහ ගෙන ඇත. ඒ සින්දු කේමදාසයන් කෙරෙහි තම සිතේ පවතින බැතියත් ලැදියාවත් පෙන්වීම සඳහා සින්දුවල කොටස් ඇද ගැනීම නිසා ඔවුන්ගේ ලියවිල්ල කමකට නැති එකක් වී යයි සිතමි.

ලක්සුමනයන් ගේ න/ණ, ල/ළ දොස් ගැන හෝ උක්තාඛ්‍යාත යෝගය ගැන හෝ යමක් කීමට අදහස් නොකරමි. ඔහු ප්‍රතිබාපූර්න ලේකක කෙනෙක් වෙති. එහෙයින් ඔවුන් තව තවත් ලිවිය යුතුය. මේ ලිපිය ඔවුන්ටත් දුහුනන්ටත් නිවැරදිව ලිවීමට දිරි දීමේ අරමුනින්ම ලියූවකි.

මා මීට පෙර කියූ කියමනක් අදත් කියමි. රජ කෙනෙකු බූරුවකු පිට නැගී නගර සංචාරය කිරීම සුදුසු නැත යනු ය ඒ.

හින්දි සින්දුවක් හෝ මන්තරයක් කියවන්නාට එහි තේරුම දැන ගැනීමේ උවමනාවක් නැත. හින්දි සින්දුවේ තේරුම දන්නා කෙනෙකු ගෙන් අසා දැන ගත හැකි. මලයාලි දෙමල සකු පාලි සිංහල වචන යොදා ගලපා ඇති මන්තරයක තේරුම සෙවීම 'නාග මානික්‍යයක්' සෙවීම වැනි වැඩකි.

වි ක ධර්මබන්ධු

සුභාෂිතයෙන්....

බලැත්තවුන් හට බන වෙරෙහි නො	නැවත
විපත් පැමිනියත් ඉන් කිසි නිගා	නැත
මහත් විදුරු ගිරි බිතකට වැද	අනුත
සුනත් දල ඇතුට ලොව අපහසෙක්	නැත

<u>නිසඳැස් කවිය</u>

බලැත්තවුන් හට
නො නැවත බන වෙරෙහි
විපත් පැමිනියත්
ඉන් කිසි නිගා නැත
මහත් විදුරු ගිරි බිතකට වැද
අනුත
දල සුනත්
ඇතුට
ලොව අපහසෙක් නැත

<u>තේරුම :</u>

බලය ඇති කෙරෙහි දිගින් දිගටම බැඳුනු වයරය නිසා (යමෙකුට) විපතක් සිදු උනත් එයින් වන ලජ්ජාවක් නැත. විසාල දියමන්ති පරුවතයකට ඇතීම නිසා තම දල කැඩී ගියත් ඇතාට ලැජ්ජාවක් නැත.

බැඳුනු = බන්, බිඳුනු = බුන්, හැඳි පැලඳි = හන් පලන්, හිඳි = හුන්, යන වචන පැරහි පත් පොත්වල දක්නට ලැබේ. වයර = වෙර යනුවෙන් සිංහලට බිඳේ. එහෙත් සාමාන්‍ය වියහරේ ඇසෙන්නේ 'වයර' හඬයි. නිග්‍රහ = නිගහ = නිගා වේ. භික්ති = බිතු + අ = බිත වේ. වියහරේ ඇත්තේ 'බිත්ති' ය. 'අනුත' වියහරට අමුතුය. ගනිත - මනිතු පනිත අනිත යන වචන එක ම විදියට සැදී ඇත. 'සුනත්' යන්නේ දාතුව ගැන නිනව්වක් මට නැත. 'සුනු විසුනු - සුන් බුන් - සුන් කර දමා - සුන් වූ පැතුම්' යනුවෙන් බහව්තේ ඇති 'සුන්' යන පදය ගැන යමක් කීමට මම නොදනිමි. 'සුනේ සුන් කලා - උනා, කුඩේ කුඩු කලා - උනා, පලේ පල් උනා - කලා වැනි තැන් විමසත එය නාම පදයක්දැයි යන සැකය ඇති වේ. සුන් සහල් යනු කැඩී කුඩු වී ගිය සහල්ය. පසුව ඒ වචනය ගැන යමික කිව හැකි වෙතැයි සිතමි. 'විදුරු ගිර' කෙසේ වෙතත් 'කුස්ට රාජ ගල' වැනි මහ ගලකට දෙ දලින් අනින්නේ වියරු වූ මෝඩ අලියෙකි.

'නහි වේරේන වේරානි' යන කියමනට මුලුමනින්ම විරුදු අදහසක් දෙන මේ කියමනෙන් වයර කිරීම හුවා දක්වා ඇති බවක් පෙනේ. කිඹුලකු මතට පීනූ 'ස්ටීව් අද්වින්' කිඹුලාගෙන් පහර කා පසු බැසීම එකකි. බලවතෙකුට (ඉරිසියාවෙන් විය හැකිය) දිගන් දිගට ම වයර බැඳ හොට බිම ඇන ගැනීම අනෙකකි.

වි. ක. ධර්මබන්ධු